# ඇබෑර්තු

# අධ්‍යක්ෂ තනතුර

## ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා පාලක මණ්ඩලය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව සහ ශ්‍රී ලංකා පශ්චාත් උපාධි පුහුණු මධ්‍යස්ථානය සඳහා අධ්‍යක්ෂ තනතුර වෙනුවෙන් සුදුසු සුදුසුකම් සහ පළපුරුද්ද සහිත වෛද්‍ය පරිපාලකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්**

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත වෛද්‍යවරයෙකු වීම.
- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් (PGIM) වෛද්‍ය පරිපාලනය පිළිබඳ MD උපාධිය ලබා තිබීම සහ වෛද්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥයෙකු ලෙස මණ්ඩල සහතිකකරණය ලබා තිබීම.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 60 නොඉක්මවීම.
- පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ වසර 7 ක පළපුරුද්දක් තිබීම.
- පුද්ගලික නායකත්වය, උපායමාර්ගික සැලසුම්කරණය, මූල්‍ය කළමනාකරණය, සායනික පාලන ගුණාත්මකභාවය, ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ මානව සම්පත් කළමනාකරණ කුසලතා පෙන්නුම් කිරීම.

**පහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ:**

- තෘතීයික සෞඛ්‍ය සේවා රෝහලක් සහ පශ්චාත් උපාධි පුහුණු ආයතන මෙහෙයවීමේ පළපුරුද්දක් තිබීම.
- සෞඛ්‍ය සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම, වෛද්‍ය අධ්‍යාපනය, පර්යේෂණ සහ සංවිධානාත්මක සංවර්ධනය පිළිබඳ තහවුරු කළ වාර්තා තිබීම.

**ප්‍රධාන වගකීම්**

**අධ්‍යක්ෂවරයා පහත සඳහන් කාර්යයන් සඳහා වගකිව යුතුය:**

- රෝහල සඳහා සමස්ත උපායමාර්ගික සහ මෙහෙයුම් නායකත්වය ලබා දීම.
- මානව සම්පත්, මූල්‍ය සහ භෞතික සම්පත් ඵලදායීව සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා, මණ්ඩල ප්‍රතිපත්ති සහ ජාතික සෞඛ්‍ය සංරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම.
- රජයේ ආයතන, විශ්වවිද්‍යාල, වෘත්තීය විද්‍යාල සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සබඳතා වර්ධනය කර ගැනීම.

**පත්වීමේ කොන්දේසි**

- ස්ථිර සහ අර්ථසාධක අරමුදල් පදනම යටතේ වේ.
- පත්වීම ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා පාලක මණ්ඩලය රෝහල් මගින් සිදු කරනු ලබයි.
- වේතනය, දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ සුදුසුකම්, පළපුරුද්ද සහ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව හිමිවේ.
- පත්වීමක් කිරීම හෝ නොකිරීම පිළිබඳ සම්පූර්ණ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා පාලක මණ්ඩලය සතු වේ.

**උනන්දුවක් දක්වන අයදුම්කරුවන් ඉදිරිපත් කළ යුතු දෑ:**

- රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් තම අයදුම්පත්, තමන් සේවය කරන ආයතන ප්‍රධානීන් මාර්ගයෙන්, සෘජු පිටපතක් ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තේරී පත් වුවහොත් අයදුම්කරු සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත.
- සවිස්තරාත්මක ජීව දත්ත සටහන (CV) / අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්වල සහතික කළ පිටපත්/ ජ්‍යෙෂ්ඨත්වය ලෙස වත්මන් රැකියාවේ නියුක්තිය පිළිබඳ සාක්ෂි .

ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

2026.08.17 දිනට හෝ ඊට පෙර පහත අත්සන් කර ඇති අය වෙත ඥාති නොවන වෘත්තීය නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් එවිය යුතුය..

**(මෙම දැන්වීම 2026.05.31 සහ 2026.06.14 යන දිනවල පළ කරන ලද දැන්වීමේ සංශෝධන සහිතව පළ කරනු ලබන එම දැන්වීමම වේ)**

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර ජෙනරල් රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2026 ජූලි 31**